
# පැරණි යුගයේ අවසන් බුද්ධිමය දැවැන්තයා නික්ම යයි.



පත්තරයකට වඩා වැඩි යමක්

සංස්කාරක - Editor
චන්ද්‍රරත්න බණ්ඩාර
Chandrarathna Bandara

වෙබ් අඩවි සංස්කාරක: රුචින්ද්‍ර අබේතුංග

රූ රටා සංස්කරණය: සමන්ත ගමගේ

ඡායාරූප සංස්කාරක: නිමල් එගොඩ ගෙදර

පරිඝනක අක්ෂර සංයෝජනය: චන්දිමා පීරිස්

දුරකථනය: 416-994-2393
Email: yathranews@gmail.com
Web: www.yathranews.com

Address:
50-2080A, LAWRENCE AVE (EAST)
TORONTO, ONTARIO, M1R2Z5

**ලංකාව** ලෝකය තුල නිර්වචනය වූයේම ජයග්‍රහණ විරහිත රටක් වශයෙනි. 1996 ලෝක ක්‍රිකට් ජයග්‍රහණය පිළිබඳව චිත්‍රය ලෝක ජයග්‍රාහි සිතුවම් වාර්තා පොතෙහි ඉහළින් ඇඳිණි. ඊට අනුයාතව තවත් කුඩා කුඩා ජයග්‍රහණ වරින් වර අසන්නට ලැබුණි. එහෙත් තිස් අවුරුදු යුද්ධයත්, දූෂිත දේශපාලනයත්, රට බංකොලොත් වීමත් යන කාරණා විසින් ඇතිරූ කලු පැල්ලම් ඒ ලැබූ ලොකු කුඩා ජයග්‍රහණ අමතකකරවන සුළුවිය. ඒ ලංකාවේ මෑත ඉතිහාසයේ තතුය.

එහෙත් ඊට පෙර දශකයන්හි ලංකාව ආලෝකමත් කළ ලෝකය දිග්විජය කළ ප්‍රාඥයෝ සිටියහ. ඉන් පළමුවැන්නා ආනන්ද කුමාරස්වාමිය. ශ්‍රී ලංකාවේ මුල් අඩ සියවසෙහි ජීවත් වූ ඔහු, කලා ඉතිහාසඥයෙක්, භූගර්භ විද්‍යාඥයෙක්, මානව වංශ විද්‍යාඥයෙක් පමණක් නොව දේශපාලන ප්‍රතිසංස්කාරකයෙක් ලෙස ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තරව නමක් තැබීය. ඒ නාමාවලිය තුල තවත් කිහිප දෙනෙක්ම ප්‍රාඥයන් සිටියහ. අද අපේ නිමිත්ත වී ඇති මහදුරු ගනනාත ඔබේසේකර ද එවැන්නෙකි.

ගනනාත ඔබේසේකරයන් අපට කාරණා ගණනාවක් නිසා වැදගත්වේ. ඉන් පළමුවැන්න ඔහු විසින් සමාජ මානව විද්‍යාවට ලංකාව පදනම් කරගෙන කරන ලද සේවාවය. ගුරුවරයෙක්, පර්යේෂකයෙක්, ග්‍රන්ථ කතෘවරයෙක් ආදී වශයෙන් ඔහුගේ සේවාව ව්‍යාප්ත වේ. ඔහුගේ කෘති තුළින් විෂද කළ දැනුම ලෝක පරිමාණව සම්භාවනාවට ලක්ව ඇත. බුද්ධිමය සම්ප්‍රදායෙන් බැහැරව, තමන් විසින්ම තමන්ගේ වර්තමානයත් අනාගතයත් විනාශ කරගන්නා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට, සදාකාලික ආදර්ශයක් විය හැකි චරිතයක් බවට එතුමන් පත්වී ඇත. ඔහු අභාවප්‍රාප්ත වීමට කෙටි කාලයක් තිබියදීත් පර්යේෂණයේ හා ලිවීමේ යෙදුණේය.


ලංකාවේ සමාජ හා මානව විද්‍යාවට අයත් සියලු භාස්කම් අයත් වන්නේ අතීත යුගයටය. දැවැන්තයෝ සිටියේ එකළය. රැල්ෆ් පීරිස්, කිත්සිරි මලල්ගොඩ, එච්.එල්.සෙනවිරත්න ඒ දැවැන්තයින් අතරින් කිහිපදෙනෙකි.

අප ගනනාත ඔබේසේකරයන්ගේ මෙහෙවර අරබයා මෙතරම් ඇගයීමක් කරන්නේ ඇයි? ඒ ඔහු තම අධ්‍යයන කාර්යයන් උදෙසා කළ කැපවීම හා ඔහුගේ පර්යේෂණයන් ලංකාව හා ලෝකයට අනේකාකාරවලින් වැදගත්වූ හෙයිනි.

සමාජ විද්‍යාව හා මානව විද්‍යාවට අයත් විෂය පථයන් වෙන්වන කඩ ඉර ඉතා සියුම් තුනී එකකි. මේ ගැන අප සමාජ විද්‍යාඥයෙකු වන ආචාර්ය සරත් චන්ද්‍රසේකරගෙන් විමසීමු. ඔහුගේ එක් හැඳින්වීමක් වූයේ සමාජ විද්‍යාඥයා සිය පර්යේෂණ නගර පදනම්ව සිදුකරන බවත් මානව විද්‍යාඥයා එය සිදුකරන්නේ ගම පදනම් කරගෙන බවත්ය.

ලංකාවේ බොහෝ විශ්වවිද්‍යාල ආශ්‍රිත ශාස්ත්‍රාලිකයන්ගේ පර්යේෂණ හා නිබන්ධන සමාජ ක්‍රියාවලියේ සංවර්ධනයට අදාළ කරගැනීමට තරම් වැදගත් නොවේ. නැත්නම් අසමත්ය. නමුත් ගනනාත එසේ නොවේ. ඔහුගේ පර්යේෂණයන් සමාජය ආලෝකමත් කිරීමට දායක විය. එක්කෝ පර්යේෂණ විෂයේ පුළුල් බව විසින් එය සමාජ අර්බුදයන් විග්‍රහ කරගැනීමට මග පෙන්වන්නක් බවට පත්වී තිබේ.

මහාචාර්ය ඔබේසේකරගේ 'දුටුගැමුණුගේ හෘද සාක්ෂිය' පිළිබඳ ප්‍රකට විශ්ලේශණයේදී ඔහු ඒ ඓතිහාසික කතාපුවතට නව අර්ථකථනයක් ලබාදේ.



දුටුගැමුණු පිළිබඳ ඉතිහාසයේ සියලු කාරණා නිවැරැදියයි ඔහු උපකල්පනය කරයි. එහෙත් දුටුගැමුණු, වංශකතාකරුවන් හා අනෙකුත් උදවිය පුරාතන ඉතිහාසය පිලිබඳ නිර්වචන දුන් ආකාරයට අනුව පසුකාලීන සමාජය විසින් දුටුගැමුණුගේ බෞද්ධ හෘද සාක්ෂිය යටපත් කොට ඇත. ඒ එසේ වන්නාසේම එළාරගේ මහාවංශයේම සඳහන් යුක්තිගරුක භාවය අමතක කර දමයි. මේ විකෘතීන් සියල්ල සිදුවන්නේ ජාතිවාදයේ උවමනාවන් වෙනුවෙනි.

ඔබේසේකරයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකුව සිට එහිම ආචාර්යවරයෙකු ලෙස සේවය කොට පසුව ඇමරිකාවේ වොෂිංටන් විශ්වවිද්‍යාලයෙන් එම්.ඒ. හා ආචාර්ය උපාධිය ලබාගත්තේය. අනතුරුව ඇමරිකාවේ ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු හා අංශාධිපතිවරයෙකු ලෙස දීර්ඝ කාලයක් සේවය කළේය. ඉනික්බිති ලංකාවට යළි පැමිනුණු ඔහු සිය පර්යේෂණ කාර්යයන් හා ග්‍රන්ථකරණය දිගටම සිදුකරගෙන ගියේය.

ගනනාත ඔබේසේකර උපන්නේ 1930 පෙබරවාරි දෙවනදා මතුගමදීය. මානව විද්‍යාඥයෙකු හා සමාජ විද්‍යාඥයෙකු ලෙස ඔහුගේ පර්යේෂණ අවධානය යොමුවූයේ මනෝ විශ්ලේෂණය, සංකේතවාදය ආගම හා සම්බන්ධ වන ආකාරය ආදිය ගැනය. ඔහුගේ පළමු වැදගත් පර්යේෂණ අතර හිනිදුම් පත්තුවේ මැදගම ග්‍රාමයේ ඉඩම් බෙදී යාම, පුද්ගල නාම සකස්වීම ආදිය පදනම් කරගෙන කෙරුණකි. (Land Tenure in Village Ceylon)

ගනනාත ඔබේසේකරයන් පිළිබඳ හරි වටහා ගැනීමක් ලංකාවේ ජාතිකවාදී බුද්ධිමතුනට තිබුණේ නැත. තිබුණා නම් තිබුණේ වැරදි අවබෝධයකි. ඔහුගේ පර්යේෂණ කෘති සියල්ල පළවූයේ ඉංග්‍රීසියෙනි. යටත් විජිත ලංකාවේ අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි වූ හෙයින් ඒ නොහැකියාව ඒ යුගයේ විද්‍යාර්ථීන්ට තිබුණි. (මහාචාර්ය සරච්චන්ද්‍ර සිය චරිතාපදානය වන 'පිං ඇති සරසවි වරමක් දෙන්නේ' කෘතියේ සඳහන් කරන පරිදි සිංහල භාෂාවේ වඩාත්ම ගැඹුරු ප්‍රවර්ධකයා වූ කුමාරතුංග මුනිදාස පවා සරච්චන්ද්‍රයන් සමග කතා කර ඇත්තේ ඉංග්‍රීසියෙනි.) එහෙත් එක්තරා පමණකට ඔබේසේකරයන් ද බටහිර විරෝධියෙකි. ඔහු හැමදාමත් විශ්වාස කළේ බටහිර විසින් ලංකාව ඇතුළු තුන්වන ලෝකයේ දැනුම පද්ධතීන් අවප්‍රමාණ කළ බවයි. ඔහුට පශ්චාත් උපාධි සඳහා එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් හෝ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයන්ට යන්නට හැකියාව තිබියදී ඇමරිකාවේ විශ්වවිද්‍යාලයක් ඒ සඳහා තෝරා ගත්තේ ඔහු තුළ රැජයූ බටහිර විරෝධය නිසා යැයි කියනු ලැබේ.

පොදුවේ ජාතිකවාදීන් බටහිර විරෝධීය. එහෙත් අරුමය වන්නේ පොදුවේ ඔවුන් ද ගනනාතට විරුද්ධ වීමය. නමුත් පොදු ජාතිකවාදීන් තම බටහිර විරෝධය ලංකාව තුල කාල්ගාද්දී ඔබේසේකරයන් ඒ කාරණයම අරබයා ලෝක පරිමාණ ව්‍යාපෘතියක් දියත් කළේය. ඔහුගේ 'The Apotheosis of captain Cook : European Mythmaking in the pacific' කෘතියේ නවසීලන්තය හා ඔස්ට්‍රේලියාව සොයා ගැනීම නිසා දේවත්වයට පත් කර ඇති කැප්ටන් කුක් ගැන අදහස් දක්වයි. ඔහු සඳහන් කරන්නේ කැප්ටන් කුක් ඔස්ට්‍රේලියාව සොයා ගත්තා නොව ඔස්ට්‍රේලියානු භූමි පුත්‍රයන් කුක්ගේ කොල්ලකාරී අරමුණු සොයා ගත් බවයි.

දහහතර වන සියවසේ ලංකාවට ඉන්දියාවේ සිට පැමිණි පවුල් දහහතරක් ආශ්‍රයෙන් නව ප්‍රභූ පැලැන්තිය ගොඩනැගී ඇති ආකාරය ඔහු විස්තර කරයි. ඔවුන් සියල්ලෝම පාහේ ද්‍රවිඩ සම්භවයක් තිබූ අයයි. සමාජ සැකැස්ම මේ ආකාරයට සමන්විත වන විට සිංහල දෙමළ භේදයක් කුමකටදැයි ඔහු ප්‍රශ්න කරයි.

ඔබේසේකරයන්ගේ අවසන් කෘති අතර වන *The Doomed King: A Requiem For Sri Vikrama Rajasinha*, 2017 කෘතියේ උඩරට ආක්‍රමණය සඳහා වූ බ්‍රිතාන්‍යයන්ගේ කුමන්ත්‍රණකාරී ස්වරූපය දක්වා තිබේ.

ගනනාත ඔබේසේකරයන්ගේ වර්ණවත් හා වටිනා දිවිසැරිය පසුගිය විසිපස්වෙනිදා වාතලයට මුසු කළේය. වසර අනූපහක් පමණ තිස්සේ වූ ඔහුගේ දිවිසැරිය ශාස්ත්‍රවන්තයෙකු විසින් ලැදිව හදාළ යුතු අපූර්වත්වයන්ගෙන් පිරුණු එකකි.

ශ්‍රේෂ්ඨයාණෙනි ඔබට සුබ ගමන්...

**සංස්කාරක**

**යාත්‍රා අන්තර්ගතය.**

යාත්‍රා පුවත්පතේ පළකරන ආගමික විශ්වාසයන් හා එවැනි පාරභෞතික කාරණා ඇතුළත් ලිපි, වෙළෙඳ දැන්වීම් ආදියෙහි අන්තර්ගතයන් පුවත්පතේ අදහස් නියෝජනය නොකරයි. එමෙන්ම ඒ ඒ ලිපිවල දේශපාලන ආස්ථානයන්ද පුවත්පතේ අදහස් නොව එවා ලියන ලේඛකයන්ගේ හා ආයතනවල අදහස් බව සැලකව මනාය. අප මේ විවිධත්වයට ඉඩ සලසා දෙන්නේ සෑම අදහසක්ම දැන ගැනීමේ පාඨක අයිතියත්, ඒවා සමාජය හමුවේ පැවතීමේ අයිතියත් අප පිළිගන්නා හෙයිනි.

**සංස්කාරක**

